උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!
ජූලි 25, 2023 දින, දිනමිණ පුවත්පතේ වාතර්ා වී ඇති දිවි තොර කර ගැනීම් බවට පැවසෙන සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. මෙම සිදුවීම්, මුල් පිටුවේ සිට එකොළොස් වෙනි පිටුව දක්වා පුවත් වාතර්ාවන් සතරක් ඔස්සේ ඉදිරිපත් වී ඇත.
* කෙසේ නමුත්, මෙම පුවත් වාතර්ාවන් සතරෙන් එකක් සමග හෝ හදිසි උපකාරක අංක ඉදිරිපත් කොට නැත.
* ඇතැම් පුවත් වාතර්ාවන්හි සිරස්තලයේම දිවි තොර කර ගත් බවට පැවසෙන ආකාරයන්ද සඳහන්ව ඇත.
* එක් සිදුවීමක් ප්රමුඛත්වයෙන් යුතුව මුල් පිටුවේම ඉදිරිපත් වී ඇත.
* ඇතැම් පුවත් වාතර්ාවන්හි අන්තගර්තයේ දිවි තොර ගත් ආකාරය විස්තරාත්මකව ඉදිරිපත් කොට ඇත.
එසේ නම්,
1) මෙම දිවි තොර කර ගැනීම පිළිබඳ පුවත් වාතර්ාවන්, මානසික සෞඛ්‍යය හෝ මහජන සෞඛ්‍යය සම්බන්ධ කෝණයකින් ඉදිරිපත් වී ඇතැයි ඔබ සිතනවා ද?
2) මෙලෙසින් දිවි තොර ගැනීම් පිළිබඳ වාතර්ාවන් ගණනාවක්, උපකාරක අංක ද නොමැතිව පළ කිරීමෙන් දිවි තොර කර ගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකුට සෘණාත්මක බලපෑමක් ඇති නොවේ යැයි සහතික වීමට හැකි ද?
3) දිවි තොර කර ගැනීම් වාතර්ාකරණය පිළිබඳ මාධ්‍ය මාගෙර්ාපදේශයන් කඩ කරමින්, දිනමිණ පුවත්පතේ පිටු පහක් පුරා ඉදිරිපත් වී ඇති මෙම දිවි තොර කර ගැනීම් සම්බන්ධ වාතර්ාවන් කෙතරම් වගකීම් සහගතව ඉදිරිපත් වී තිබේ ද?
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්යෙන් සම්බන්ධ කරගත හැක)
මූලාශ්‍ර:
https://apps.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://accountablejournalism.org/.../australia-standards...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!